# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1997 අංක 15 දරන සමථ මණ්ඩල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1997 ජූලි මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 ජූලි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 05, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

2 - CM 021643

[සහතිකය සටහන් කළේ 1997 ජූලි මස 22 වැනි දින.]

එල්. ඩී.– ඕ. 49/91

## 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 1997 අංක 15 දරන සමථ මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය"යනුවෙන් සඳහන් කරනු ලබන)1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ යෙදෙන "12 වන වගන්තියේ හෝ 14 (2) වන වගන්තියේ සඳහන් නිරවුල් නොකිරීමේ සහතිකය" යන වචන සහ ඉලක්කම් වෙනුවෙට "14 අ වගන්තියේ සඳහන් නිරවුල් නොකිරීමේ සහතිකයක් "යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1998 අංක 72 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(1) 6 වන වගන්තිය යටතේ වූ ඉල්ලීමක් ලැබුණු විට හෝ 7 වන වගන්තිය හෝ 8 වන වගන්තිය යටතේ තමා වෙත යොමු කිරීමක් ලැබුණු විට, සමථ මණ්ඩල ප්‍රදේශයක් සඳහා පත් කරන ලද මූල මණ්ඩලයක සභාපතිවරයා විසින්, සමථ මණ්ඩලයක් පිහිටුවන ආකාරය පිළිබඳව ආරාවුල්කරුවන්ගෙන්, ඔවුන්ගේ වැඩි කැමැත්ත පිළිබඳව නිසැකව දැන, ආරාවුල්කරුවන් විසින් ප්‍රකාශිත වැඩි කැමැත්තට අනුකූලව, පහත දැක්වෙන දේ වලින් කිසිවක් කරනු ලැබිය යුතු ය :–

(i) (2) වන උපවගන්තිය යටතේ සමථ මණ්ඩලයක් පිහිටුවීම; නැතහොත්

(ii) (3) වන උපවගන්තිය යටතේ කලින් පිහිටුවන ලද මණ්ඩලයක් තෝරා ගැනීමට ආරාවුල් කරුවන්ට අවසර දීම.

(2) (1)වන උපවගන්තිය යටතේ සමථ මණ්ඩලයක් පිහිටුවීම සඳහා සියලුම ආරාවුල්කරුවන් විසින් වැඩි කැමැත්තක් ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක, සමථ මණ්ඩල ප්‍රදේශයක් සඳහා පත් කරන ලද මූල මණ්ඩලයක සභාපතිවරයා විසින් -

(අ) එක් එක් ආරාවුල්කරු විසින් තෝරා ගනු ලබන එක් සාමාජිකයකුගෙන්; සහ

(ආ) (අ) ඡේදය යටතේ තෝරා ගන්නා ලද සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන එක් සාමාජිකයකුගෙන්

සමන්විත (මෙහි මින් මතු " මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත මණ්ඩලයක්, ඒ සමථ මණ්ඩල ප්‍රදේශය සඳහා පත් කරන ලද මූල මණ්ඩලයෙන් පිහිටුවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, (අ) ඡේදයේ සඳහන් ආරාවුල්කරුවන්ට හෝ (ආ) ඡේදයේ සඳහන් සාමාජිකයන්ට ඔවුන්ගේ ඒ ඒ තේරීම් ගැන එකඟත්වයට පැමිණීමට නොහැකි වන අවස්ථාවක, මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින් අවශ්‍ය තේරීම කරනු ලැබිය යුතු ය:

එසේ ම තවදුරටත්, (අ) ඡේදයේ සඳහන් යම් ආරාවුල්කරුවකු ඒ ඡේදය යටතේ තේරීමක් කිරීමට තමාගේ අකමැත්ත ලියවිල්ලකින් ප්‍රකාශ කරන අවස්ථාවක, ඒ තේරීම් මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින් කුසපත් ඇදීමෙන් කරනු ලැබිය යුතු ය. ආරාවුල්කරු යම් හේතුවක් නිසා කුසපත් ඇදීමෙන් ප්‍රථමයෙන් තෝරා ගනු ලැබූ සමාජිකයා සම්බන්ධයෙන් විරුද්ධත්වය දක්වනු ලබන අවස්ථාවක, සභාපතිවරයා විසින් කුසපත් ඇදීමෙන් තවත් තේරීමක් කරනු ලැබිය යුතු ය.

(3) ඉල්ලීම හෝ යොමු කිරීම කරන ලද්දේ යම් ආරාවුලක් හෝ වරදක් සම්බන්ධයෙන් ද ඒ ආරාවුල හෝ කලින් පිහිට වූ මණ්ඩලයක් වෙත යොමු කිරීම සඳහා සියලුම ආරවුල්කරුවන් වැඩි කැමැත්තක් ප්‍රකාශ කරන අවස්ථාවක, ඒ සමථ මණ්ඩල ප්‍රදේශය සඳහා පත් කරන ලද මූල මණ්ඩලයෙන්, සභාපතිවරයා විසින් කලින් පිහිටුවන ලද (සභාපතිවරයා විසින් පත් කරන ලද "ප්‍රධාන සමථකාරවරයෙකු" ද ඇතුළුව) සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත එක් එක් මණ්ඩල අතුරින් යම් මණ්ඩලයක් තෝරා ගැනීම සඳහා මූල මණ්ඩලයේ සභාපතිවරයා විසින් ආරාවුල්කරුවන්ට අවසර දෙනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති, ඒ වගන්තියේ (4)වන සහ (5) වන උපවගන්ති වශයෙන් පිළිවෙළින් නැවත අංක කිරීමෙන්;

(3) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (4) වන උපවගන්තියෙහි "(1) වන උපවගන්තියේ " යන වචන සහ ඉලක්කමේ සිට " මණ්ඩලයේ ප්‍රධාන සමථකාරවරයා ලෙස ක්‍රියා කළ යුතු ය; " යන වචන තෙක් වූ කොටස වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"(2) වන උපවගන්තියේ (අ) ඡේදයේ යටතේ තෝරා ගන්නා ලද සාමාජිකයා, ඒ උපවගන්තිය යටතේ පිහිටුවන ලද මණ්ඩලයේ ප්‍රධාන සමථකාරවරයා වශයෙන් ක්‍රියා කරනු ලැබිය යුතු ය''.

(4) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (5) වන උපවගන්තියේ" මණ්ඩලය පිහිටුවීමෙන් පසු" යන වචන වෙනුවට, "මණ්ඩලය පිහිටුවීමෙන් හෝ තෝරා ගැනීමෙන් පසු" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) "9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "9 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (අ) ඡේදයෙහි "වෙනත් තැනැත්තන්ට දැනුම් දීම;" යන වචන වෙනුවට,"වෙනත් තැනැත්තන්ට දැනුම් දිය යුතු අතර, එවැනි යම් සාකච්ඡාවකට පැමිණීමට ආරාවුල්කරුවන් අතුරින් යම් තැනැත්තෙකු අපොහොසත් වුවහොත්, ඒ ආරාවුල්කරුගේ නොපැමිණීම 14අ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබිය හැකි නිරවුල් නොකිරීමේ සහතිකයේ හෝ 12 වන වගන්තියේ (අ) ඡේදය යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවේ හෝ සඳහන් කෙරෙන බව ඒ නිවේදනයෙන් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (ඈ) ඡේදයේ ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(ඈ) 13 වන වගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත තම කටයුතු සම්පූර්ණ කිරීම සහ එසේ කිරීමට අපොහොසත් වූ විට, 14 අ වගන්තිය යටතේ කටයුතු කිරීම".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

"නිරවුල් කිරීමක් කළ නොහැකි අවස්ථාවක.

12. නිසි දැනුම් දීමකින් පසුව, ආරාවුල්කරුවන් අතුරෙන් යම් ආරාවුල්කරුවකු නොපැමිණීම නිසා, 9 වන වගන්තිය යටතේ මණ්ඩලයක් පිහිටුවීමට නොහැකි අවස්ථාවක හෝ 9 වන වගන්තිය යටතේ මණ්ඩලයක් පිහිටුවීමෙන් පසු ආරාවුල්කරුවන් නිරවුල් කිරීමකට එකඟ නොවන්නා වූ හෝ නිසි දැනුම් දීමකින් පසුව ආරාවුල් කරුවන් අතුරෙන් යම් ආරාවුල්කරුවකු නොපැමිණීම නිසා නිරවුල් කිරීමකට එළඹිය නොහැකි අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි සභාපතිවරයා හෝ ප්‍රධාන සමථකාරවරයා හෝ විසින් –

*(අ)* 6 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, 14 අ වගන්තිය යටතේ කටයුතු කරගෙන යාම;

*(ආ)* 7 වන වගන්තිය හෝ 8 වන වගන්තිය යටතේ යම් අධිකරණයක් විසින් යොමු කරන ලද ආරාවුලක් සම්බන්ධයෙන් වන විට, සමථයට පත් කිරීමෙන් ආරාවුල නිරවුල් කිරීමට නොහැකි වූ බව සහ නිරවුල් නොකිරීමට හේතු දක්වමින්, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ ප්‍රධාන සමථකාරවරයා විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙහි ඒ අධිකරණය වෙත වාර්තා කිරීම, කරනු ලැබිය යුතු ය".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

13. සමථ කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මණ්ඩලය ඉදිරියේ ඇති සෑම ආරාවුලක්ම හෝ වරදක්ම සම්බන්ධයෙන්, ඒ මණ්ඩලය විසින් - "මණ්ඩලය ක්‍රියා කළ යුතු කාල සීමාව".

(අ) ආරාවුලක් සම්බන්ධයෙන් වන විට මණ්ඩලය පිහිටුවීමෙන් දින හැටක් ඇතුළත; හා

(ආ) වරදක් සම්බන්ධයෙන් වන විට, මණ්ඩලය පිහිටුවීමෙන් දින තිහක් ඇතුළත

11වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි හෝ 12 වන වගන්තියේ සඳහන් පියවර ගනු ලැබිය යුතු ය."

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (2) උපවගන්තියෙහි, "එවැනි මතභේද විසඳිය නොහැකි අවස්ථාවක"යන වචනවල සිට, ඒ උපවගන්තිය අවසානය තෙක් වූ සියලුම වචන වෙනුවට," එවැනි මතභේද විසඳිය නොහැකි අවස්ථාවක, මණ්ඩලය විසින් 14 අ වන වගන්තිය යටතේ කටයුතු කරගෙන යා යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම

8. 14 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 14 අ සහ 14 ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියේ 14 අ සහ 14 ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

14අ. මේ පනතේ විධිවිධාන යටතේ යම් ආරාවුලක් හෝ වරදක් නිරවුල් කිරීමට නොහැකි වූ අවස්ථාවක හෝ නිරවුල් කිරීමකට පසු ආරාවුල්කරුවන් අතර උද්ගත වූ යම් මතභේද විසඳීමට නොහැකි වූ අවස්ථාවක, එම ආරාවුල හෝ වරද සමථ කිරීමෙන් නිරවුල් කිරීමට නොහැකි වූ බවටත් , එසේ නිරවුල් කිරීමට නොහැකි වූ හේතූන් සඳහන් කරමින් අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ ප්‍රධාන සමථකාරවරයා විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙහි වූ නිරවුල් නොකිරීමේ සහතිකයක් අවස්ථාවෝචිත පරිදි සභාපතිවරයා හෝ ප්‍රධාන ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය. නිරවුල් නොකිරීමේ සහතික.

14ආ. (1) 14 අ වන වගන්තිය යටතේ නිකුත් කරන ලදැයි අදහස් කරන්නා වූ ද, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ ප්‍රධාන සමථකාරවරයා විසින් අත්සන් කරන ලද්දා වූ ද, නිරවුල් නොකිරීමේ සහතිකයක්, යම් සාක්ෂිවලදී භාරගත හැකි නිරවුල් නොකිරීමේ සහතික.

අධිකරණයක පවරන ලද යම් නඩුවකදී හෝ නඩු කටයුත්තක දී එම තැනැත්තා සාක්ෂිකරුවකු වශයෙන් කැඳවනු නොලැබ, ඇත්තේ වුව ද, සාක්ෂිවල දී භාර දෙනු ලැබිය හැකිය:

(2) යම් නිරවුල් නොකිරීමේ සහතිකයක ඇති අත්සන සැබෑ බවට සහ එය අත්සන් කරන තැනැත්තා එය අත්සන් කළ අවස්ථාවේ දී ඒ තනතුර දැරූ බවට අධිකරණය විසින් පූර්ව නිගමනය කරනු ලැබිය හැකිය:

එසේ වුව ද, යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීමක් මත, හෝ වෙනත් හේතුවක් නිසා යම් අවස්ථාවකදී වාර්තා ගත කළ යුතු හේතූන් මත, ඒ අධිකරණය ඉදිරියේ ඇති යම් නඩු කටයුත්තක දී සාක්ෂිදීම සඳහා මූල මණ්ඩලයේ සභාපතිවරයා හෝ ප්‍රධාන සමථකාරවරයා පැමිණීම අවශ්‍ය බව අධිකරණයේ මතය වුවහොත් , ඒ සභාපතිවරයා හෝ ප්‍රධාන සමථකාරවරයා ඒ සහතිකය අත්සන් කිරීම සම්බන්ධයෙන් පමණක් සාක්ෂි දීමේ කාර්යය සඳහා සාක්ෂිකරුවකු වශයෙන් කැඳවනු ලැබිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, 12වන වගන්තිය හෝ 14 (2) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සහතිකයේ" යන වචන හා ඉලක්කම් වෙනුවට,"14 අ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සහතිකයේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ, "ආරාවුල්කරු" යන අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :– ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

"ප්‍රධාන සමථකාරවරයා" යන්නෙන්,

9 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ තෝරාගනු ලබන හෝ ඒ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ මූල මණ්ඩලයේ සභාපති විසින් පත් කරන ලද, මණ්ඩලයේ සමාජිකයා අදහස් වේ;

11. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ 12 වන විෂයය වෙනුවට, පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන්, ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

"12. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් අනුප්‍රමාණයකට අනුව සහ යම් කොන්දේසිවලට යටත්ව, යම් දීමනා, සභාපතිවරයාට සහ අනිකුත් සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "ජීවිතයට අන්තරායකර ක්‍රියාවක් මඟින් තුවාල කිරීම" යන විෂයය සහ එහි II වන තීරයේ අනුරූප සටහන වෙනුවට, පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන්, ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

"ජීවිතයට අන්තරායකර ක්‍රියාවක් මගින් තුවාල කිරීම............................328"

13. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.